**ශීර්ෂය 115 - බලශක්ති අමාත්‍යාංශය**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බලශක්ති අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුලි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 නොවැම්බර් 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය

යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ 1.6.3 ජේදයේ දක්වා ඇති නිරීක්ෂණ හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිලිබදව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂය අවසානයේ චෙක්පත් ලියා තිබුණද, විගණන දිනය (2022 ජුනි 07) වන විටත් අමාත්‍යාංශයට විධිමත් පරිදි ලැබී නොතිබූ රු. 445,000 ක් වූ Desktop CPU පරිගණකයක් ප්‍රවර්ථන වර්ෂයේදී මිලදී ගැනීම් ලෙස සලකා වත්කම් වලට එකතු කර තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මෙම පරිගණකය 2021.12.31 දින වනවිට වත්කමක් ලෙස සිගූස් මෘදුකාංගය වෙත ඇතුලත් කරන ලදී. පසුව පිරිවිතරයන්ට නොගැලපීම නිසා එම ආයතනය වෙත ආපසු ලබාදී තිබුණි. පසුව විකුනුම්කාර ආයතනය ඉල්ලුම් කල වර්ගයේ පරිගණකයක් ලබා දීමට නොහැකි බවත් දන්වා ඇති අතර ඒඅනුව 2022 මැයි මාසයේ දී චෙක්පත් අංක 380787 දරණ හා රු. 445,000 ක මුදල රජයේ ආදායමට බැරකරන ලද අතර 2022 ජුනි මස මෙම ඩෙස්ක්ටොප් වර්ගයේ පරිගණකය සිගූස් මෘදුකාංගයෙන් ඉවත්කර ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කරන ලදී. | වත්කම්, මිලදී ගැනීම් ක්‍රියාවලිය සම්පූර්ණ වූ පසු ගිණුම්ගත කළ යුතුවේ. චෙක්පත් ලියා ළග තබා ගැනීම නොකළ යුතුය. |

### 1.6.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ අත්තිකාරම් ගෙවීම රු. 2,022,233 ක් ලෙස දක්වා තිබුණද, අත්තිකාරම් ගිණුම්වලට අනුව එම මුදලින් ගෙවීම රු.2,021,516 ක් වී තිබුණි. | ස්ථාන මාරු වී පැමිණි නිලධාරියෙකුගේ වැටුපෙන් අය කර ගත් ණය වාරිකය හා පොලී මුදල අතපසුවීමකින් වැරදි ලෙස සටහන් කර ඇති අතර මෙම වරද අනාවරණය කර ගැනීමෙන් අනතුරුව නිවැරදිව සටහන් කර ඇත. කෙසේ වුවද, මෙය අත්තිකාරම් බී ගිණුමේ ශේෂයට බලපෑමක් සිදුවී නොමැත. | අත්තිකාරම් ගිණුමේ හර හා බැර සටහන් නියමිත විෂය අංකය යටතේ නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.3 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත්කිරීමේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අනුරූපී අගයන් සියල්ලම ආවරණය වන පරිදි ඊට අදාළ විස්තරාත්මක සටහනක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2021/03 අනුව සිදුකරන ලදී. 2021 මූල්‍ය ප්‍රකාශන ආකෘතිය 2020 වර්ෂයට වඩා වෙනස් වූ බැවින්, 2020 වර්ෂයේ දත්ත සමඟ සැසඳීම පහසුවීම පිණිස 2020 වර්ෂයේ පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයද 2021/03 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව පිළියෙල කිරීමට මුදල් අමාත්‍යාංශය විසින් දැනුවත් කර ඇත. ඒ අනුව, 2021 වර්ෂයේ ගිණුම පිළියෙල කරන | විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශණවල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විට 2020 වර්ෂයේ ගිණුමේ දත්ත අනුරූපීව ගලපන ලදී. | |
| (ආ) | 2020 විගණිත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ලැබීම් ලෙස දක්වා තිබූ රු. 976,406 ක් වූ ශේෂය ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි ඊට අනුරූපී සංඛ්‍යාව ලෙස හෝ නැවත ගලපන ලද සංසන්දනාත්මක සංඛ්‍යාවට අදාල සංඛ්‍යාව ලෙස හෝ වෙනත් විධිමත් අනාවරණයක් ඉදිරිපත්කර නොතිබුණි. | 2020 වර්ෂයේ දී වෙනත් ආදයම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් වූ රු. 979,406 ක් වූ මුදල 2020 වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේ දී ආදායම් නොවන ලැබීම් යටතේ ගිණුම් ගත කර තිබුණි. 2021 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේ දී වෙනත් ආදායම් ශීර්ෂ යටතේ එකතු කරන ලද ආදායම සැලකිල්ලට නොගෙන 2021.12.31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අංක 2021/03 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයන්ට අනුකූලව පිළියෙළ කර ඇත. | පසුගිය කාලච්ඡේදයේ අනුරූපී සංඛ්‍යාව ලෙස හෝ නැවත ගලපන ලද සංසන්දනාත්මක සංඛ්‍යාවට අදාළ සංඛ්‍යාව ලෙස හෝ වෙනත් විධිමත් අනාවරණයක් ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2020 විගණිත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම් යටතේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා තිබූ රු. 4,430,717 ක් හා ජංගම වගකීම් යටතේ අග්‍රිම ශේෂය ලෙස දක්වා තිබූ රු. 4,430,717 ක් වූ ශේෂ ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අනුරූපී සංඛ්‍යා ලෙස දක්වා නොතිබුණි. | 2020.12.31 දිනට භාණ්ඩාගාරය වෙත පියවන ලද රු. 4,430,717 ක් වූ මුදල 2020.12.31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ මුදල් හා සමාන දෑ හා ජංගම වගකීම් යටතේ අග්‍රිම ශේෂය ලෙස සඳහන් කර තිබුණි. එසේ වුවද, මෙම මුදල 2020.12.31 දිනට භාණ්ඩාගාරයට පියවා ඇති බැවින් එම ශේෂය සැලකිල්ලට නොගෙන නැවත ගලපන ලද ගිණුම සකස් කර ඇත. | පසුගිය කාලච්ඡේදයේ අනුරූපී සංඛ්‍යාව ලෙස හෝ නැවත ගලපන ලද සංසන්දනාත්මක සංඛ්‍යාවට අදාල සංඛ්‍යාව ලෙස හෝ වෙනත් විධිමත් අනාවරණයක් සිදුකළ යුතුය. |
| (ඈ) | 2020 වර්ෂයේ විගණිත මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව අග්‍රිම ලැබීම රු. 38,000,000 ක් වූ අතර, ප්‍රවර්ථන වර්ෂයේ ඊට අනුරූපී අග්‍රිම ලැබීම රු. 38,297,067 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද, එම වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව්කර නොතිබුණි. | 2020 වර්ෂයේ මෙම අමාත්‍යාංශය විදුලිබල අමාත්‍යාංශය හා එක්ව කැබිනට් අමාත්‍යාංශයක් ලෙස 2020.08.31 දක්වා ක්‍රියාත්මක වූ අතර 2020.09.01 දින සිට වෙනම වැය ශීර්ෂයක් යටතේ ක්‍රියාත්මක විය. මැතිවරණ කොමිසම මැතිවරණ රාජකාරී සඳහා නිරතවූ නිලධාරීන්ට ගෙවීම සඳහා වර්ෂය මුල ලබා දී තිබූ රු. 297,067 මුදල වැය ශීර්ෂ 119 දරණ විදුලිබල අමාත්‍යාංශය මඟින් අලුතින් ඇතිකරන ලද 115 දරණ වැය ශීර්ෂයට මාරුකරන ලදී. ඒ මත මෙම වෙනස සිදුවී ඇත. | වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ රු. මිලියන 130 ක් වූ ඇස්තමේන්තුගත මූලික ආදායම නැවතත් රු. මිලියන 162 ක් ලෙස සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද, සත්‍ය ආදායම රු. මිලියන 225 ක් දක්වා එනම් සංශෝධිත ඇස්තමේන්තු ආදායම මෙන් සියයට 39 ක ප්‍රමාණයකින් වර්ධනය වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු පිළියෙළ කිරීම තාත්වික මට්ටමක නොවුණි | 2021 වර්ෂයේ මූලික ආදයම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 130 ක් වූ අතර එය රුපියල් මිලියන 162 ක් දක්වා වර්ෂය තුලදී සංශෝධනය කරන ලදී. එවකට රටේ පැවති කොරෝනා 19 වසංගත තත්ත්වය මත ආදායම අඩුවීමක් අපේක්ෂා කළද 2021 වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 225 ක් දක්වා ආදායම ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබුණි. මෙයට හේතුව ලෙස ලිහිසි තෙල් හා තාර ආනයනය සඳහා අනුමැතිය ලබා ගත් ආයතන ප්‍රමාණය ඉහල යාම හේතුවෙන් අයකරගත් ලියාපදිංචි ගාස්තු තුළින් ජනිත වූ ආදායම වැඩිවීම් හා තාර ආනයනය මත අයකරන විචල්‍ය ආදායම ඉහල යාම පෙන්වා දිය හැකිය. | ඇස්තමේන්තුගත ආදායම හැකිතාක් නිවැරදිව පිළියෙළ කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් 15 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට 100 අතර ප්‍රමාණයකින් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අමාත්‍යතුමා හමුවීමට පැමිණෙන විශේෂ ආරාධිතයන් සීමා කිරීම හා සෞඛ්‍ය ආරක්ෂිත මාර්ගෝපදේශ මත සංග්‍රහ කටයුතු සිදු කිරීම, වාහන, උපකරණ හා යන්ත්‍රෝපකරණ භාවිතය අඩු වීම නිසා අලුත්වැඩියා වියදම් අඩු වීම, විදුලිය හා ජලය භාවිතය අවම මට්ටමක පැවතීම, ආයතන වසා තැබීම හේතුවෙන් පවිත්‍රතා වියදම් අවම මට්ටමක පවත්වා ගැනීමට හැකිවීම, අමාත්‍යාංශය වෙනත් ගොඩනැගිල්ලක් වෙත විතැන් කිරීමට කටයුතු සිදු නොවීම, යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට හැකියාවක් නොවීම, හැකි සෑම විටම භාණ්ඩාගාරයට අවම බරක් දැරීමට හැකි අයුරින් වියදම් කළමනාකරණ කිරීම මත වියදම් සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. අමාත්‍යාංශයේ පවතින | මු.රෙ. 30(ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වාහන වසර 5කට වැඩි පැරණි වාහන වීම හේතුවෙන් රක්ෂණ වියදම අඩු වීම කල්බදු පදනම මත ලබාගත් වාහනය සඳහා වර්ෂයක කාලය ඉකුත් වූ පසු නැවතත් එම කාලය දීර්ඝ කරන බව පැවසුවද එය සිදු නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | |
| (ආ) | වැය විෂයයන් 07 ක් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය මෙන් සියයට 15 සිට සියයට 79 අතර ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකර තිබුණි. තවද, කාලච්ඡේදය තුළදී වැය විෂයයන් 06 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් හා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ මූලික ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය මෙන් සියයට 40 සිට සියයට 12,984 දක්වා ප්‍රමාණයක් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. | නව නිලධාරීන්ගේ පැමිණීම හේතුවෙන් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත හා අතිරේක ප්‍රතිපාදන ලබා නොදෙන බව පැවසීමෙන් පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවට ඉතිරි වැය විෂයයන්ගෙන් ප්‍රතිපාදන මාරු කර ගැනීම, ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් අතිකාල සඳහා දැරියයුතු වියදම් දැරීම, ඛනිජ තෙල් ගවේශණය සම්බන්ධ වෙනත් රටවල ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීම සඳහා පැවති විදේශ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම අත්‍යාවශ්‍ය වූ බැවින් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා වසර 5කට වැඩි පැරණි වාහන නඩත්තු වියදම් ඉහළ යාම, අමාත්‍යතුමන්ගේ නිල නිවස පූර්ණ අලුත්වැඩියාවක් සිදුකිරීම, විදේශ සම්මන්ත්‍රණ හා සමුළු සඳහා අමාත්‍යාංශ නිලධාරීන් සහභාගී වීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම, ප්‍රවාහන හා ඉන්ධන දීමනාව හිමි නිලධාරීන් පැමිණීම හා අනෙකුත් නිලධාරීන්ට සංචිත වාහන මගින් ප්‍රවාහන පහසුකම් සැපයීම හේතුවෙන් ඉන්ධන සඳහා වන වියදම ඉහළ යෑම, වාහන අලුත්වැඩියාව සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ලබා දී ඇති මුදල ප්‍රමාණවත් නොවීම, නව යන්ත්‍ර මිලදී ගැනීම නොහැකි වීම හේතුවෙන් පැවති පැරණි යන්ත්‍ර අලුත්වැඩියා කරගැනීමට සිදුවීම ආදී හේතු නිසා මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන මාරු කිරීමට සිදුවිය. | - එම - |
| (ඇ) | ප්‍රවර්ථන වර්ෂය තුළදී වැය විෂයයන් 02 කට අදාල ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම (සියයට සියයක්) හා තවත් වැය විෂයයන් 4 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 සිට සියයට 45 දක්වා ප්‍රමාණයක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | විදේශ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම අත්‍යාවශ්‍ය වූ නිසා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රතිපාදන සලසා ගත්තද නොවැළැක්විය හැකි හේතුවක් මත ඒ සඳහා සහභාගී වීමට ගරු අමාත්‍යතුමාට නොහැකි විම, ගරු ඇමතිතුමන්ගේ හා කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සඳහා පූර්ණ අලුත් වැඩියා වියදම් ඇති නොවීම, පැවති වසංගත තත්ත්වය හේතුවෙන් භාණ්ඩ ආනයනය සීමා සහිත වීම හා ඩොලරයක වටිනාකම රුපියලට සාපේක්ෂව ඉහළ අගයක | - එම - |

| | | | |
|---|---|---|---|
| | | පැවතීම හේතුවෙන් භාණ්ඩ මිල ගණන් ඉහළ අගයක පැවතින. කාර්යාල වසා තැබීම හේතුවෙන් නඩත්තු වියදම් අඩු වීම, රට තුළ පැවති කොවිඩ් 19 වසන්ගත තත්ත්වය මත කාර්යාල වසා තැබීම හේතුවෙන් මූලධන වියදම් වර්ෂය මුල් කාර්තු තුළ සිදු නොවීම , 2021.08.28 නිකුත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව නව ප්‍රාග්ධන ව්‍යාපෘති අත්හිටුවීම. සහ ස්වභාවික වායු ප්‍රතිපත්තියට අදාල කටයුතු වර්ෂය තුළ සිදු නොවීම යනාදී හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | |
| (ඈ) | වැය විෂයයන් දෙකකට අදාළව ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිවිමට හේතු වශයෙන් “2021 අගෝස්තු 21 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ අමාත්‍ය මණ්ඩල සංශෝධන අනුව නව ප්‍රාග්ධන ව්‍යාපෘති අත්හිටුවා ඇති නිසා ප්‍රතිපාදන උපයෝජනය නොකළ බව” ලෙස දන්වා තිබුණද, එම සංශෝධනය සිදු කරන ලද අවස්ථාව දක්වා මාස 08 ක් වන තුරු ද කිසිදු වියදමක් දරා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි | - එම - |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේදීම නිදහස් කළ යුතු අතර, කිසිඳු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවටත්, එම උපදෙස් වලට පටහැනිව ඇතිකර ගන්නා වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් ලබා දී තිබුණි. එහෙත් එම උපදෙස් නොසලකා සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරි වූ මුදල් ශේෂය ඉක්මවා | වාර්ෂික ඇස්තමේන්තුව පිළියෙළ කිරීමේ දී ඉල්ලුම් කළ ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තු මඟින් ලබා නොදීමත් අමතර ප්‍රතිපාදන 2021 වර්ෂයේ දී ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් අනිවාර්යයෙන් දැරිය යුතු වියදම් සඳහා වියදම් ප්‍රමාද කළ හැකි වැය විෂයයන් වලින් මු.රෙ. 66 යටතේ මාරුකර ගැනීමට කටයුතු කිරීම මත මෙම තත්ත්වය ඇතිවී ඇති අතර ඉදිරියේ දී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම වර්ෂයේදීම නිදහස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු. 3,146,930 ක් දක්වා බැරකම්වලට එළඹ තිබුණි. | | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සටහන් (iii) අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී බැදීම් හා බැරකම් ප්‍රමාණය රු. 3,248,403.97 ක් ලෙස දක්වා තිබුණද, එදිනට රු. 3,458,084 ක් දක්වා බැදීම් හා බැරකම් පැවති බවට නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි | නිවරදි ශේෂයන් ගිණුම් තුළට ගැනීමට හෝ උචිත පරිදි ඒවා මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමට හෝ කටයුතු කළ යුතුය. |

**2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂ**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ප්‍රවර්තන වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රු. මිලියන 2 සිට රු. මිලියන 3 දක්වා සහ අවම ලැබීම් සීමාව රු. 500,000 සිට රු. මිලියන 2.4 දක්වා වැඩි කර ගෙන තිබුණ ද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව වියදමේ උපරිම සීමාව රු. මිලියන 2 ක් හා අවම ලැබීම් සීමාව රු. 500,000 ක් ලෙස පැවතුණි. ඒ අනුව, භාණ්ඩාගාර පොත්වල එම සීමාවන් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි | අමාත්‍යාංශයේ පොත්වල ශේෂයන් සමග භාණ්ඩාගාර ශේෂයන් ගැලපිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගෙවීමට අදාල සීමාවන් ප්‍රතිශෝධනය කර තිබුණද, මුදල් රෙගුලාසි 506(D) ප්‍රකාරව පිළියෙල කරනු ලබන රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් B ගිණුමේ අනුමත ප්‍රතිශෝධන සීමාවන් දක්වා නොතිබූ අතර විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් ලෙස ප්‍රතිශෝධිත සීමාවන් දක්වා තිබුණි. | 2021.10.26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව අත්තිකාරම් බී ගිණුමේ සීමා සංශෝධනය කරන ලදී. එම සීමාව සිගැස් වැඩසටහනට ඇතුලත් කර ගිණුම් සාරාංශය මඟින් භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇත. | අත්තිකාරම් බී ගිණුමේ සීමාවන් සංශෝධනය ගිණුම්වල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 502(ආ) හි 1 වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරි විසින් අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතු කර ගනු ලබන බවට වග බලා ගත යුතු වුවද 2012 වර්ෂය | මෙම ණය මුදල අයකර ගැනීම සඳහා පවරා ඇති අංක DMR/5184/2018 දරණ නඩුව නිෂ්ප්‍රභා කර ඇති බව නීතිපති දෙපාර්තමේන්තු ලිපි අංක | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සිට සේවය අතහැර ගොස් ඇති රියදුරු මහතෙකුගේ රු. 67,884 ක ආපදා ණය ශේෂය වසර 09 ක් ගත වී ඇතත් මේ දක්වා අය කර ගෙන නොතිබුණි. | PRD/1/3/2/49 හා 2022.05.09 දිනැති ලිපියෙන් දන්වා ඇත (ඇමුණුම - 06). ඒ අනුව, ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | |

**2.5 බැංකු ගිණුම් පවත්වාගැනීමේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය අවසානයේ චෙක්පත් ලියා තිබුණද විගණන දිනය (2021 ජුනි 07) වන විටත් අමාත්‍යාංශයට ලැබී නොතිබූ එකතුව රු. 79,056 ක් වූ Toshiba වර්ගයේ Toner 02 ක් සඳහා නිකුත්කර තිබූ චෙක්පත විගණිත දිනය වන විටද නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පතක් ලෙස පැවැතුණි. | ටෝනර් 03 ක් මිලදී ගැනීම සඳහා 2021.12.13 දින ඇනවුම් කර තිබුනද 2021.12.30 දක්වාම ලැබී නොතිබුණි. ඒ අනුව හදිසි අවශ්‍යතාවය මත රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් 2021.12.30 දින ටෝනර් 02 ලබාගෙන ප්‍රයෝජනයට ගැණුනි. කෙසේ වුවද, මෙසේ මිලදී ගෙන ඇති ටෝනර් සෘජුවම අදාල පාලන අංශය විසින් භාරගෙන ගිණුම අංශයට වාර්තා නොවීම හේතුවෙන් 2021.12.31 දිනට තොග පොත්වලට ඇතුළත් නොවීම හේතුවෙන් අදාල චෙක්පත නිකුත් නොකර රඳවා තබා ගැනීමට කටයුතු කර ඇත. අනතුරුව 2022.06.24 එකී ගෙවීමට අදාල චෙක්පත දින දීර්ඝ කර නිකුත් කර ඇත. | චෙක්පත් ලියා ළඟ තබා ගැනීම නොකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉන්ධන සැපයුමේ ගුණාත්මත තත්ත්වය ආරක්ෂා කිරීමට හා විශ්වාසනීයත්වය ඇති කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, පසුවිපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ කාර්යයක් වුවද, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) යන ආයතන දෙකම ආවරණය වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය මගින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන බවට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අමාත්‍යාංශය මට්ටමින් පැවැත්වෙන මාසික කළමනාකරණ රැස්වීම්වලදී අවශ්‍ය කරුණු සාකච්ඡාවට ගනු ලැබේ. මෙහිදී, ආයතන විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වල ප්‍රගතිය සමාලෝචනය, විගණන විමසුම් මගින් ඉදිරිපත් කර ඇති කරුණු සාකච්ඡා කිරීම, සමාලෝචනය, ආයතනික, මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් සමාලෝචනය හා එක් එක් ආයතනවල මූල්‍ය ලාභදායිත්වය, පාරිභෝගික තෘප්තියක් ඇතිවන ලෙස පවත්වාගෙන යාමට අදාල තීරණ ගැනීම් හා මඟ පෙන්වීම් කරනු ලැබේ.<br><br>● තවද, ආයතනික කටයුතු, ඒවා පිහිට වූ අණ පනත්/ සාංගමික ව්‍යවස්ථාවලිය හා අදාළ ගිවිසුම්වලට අනුගතවීම් පිළිබඳව නිරන්තරයෙන් අවධානය යොමු කරමින් කාලීනව ඒවාට අවශ්‍ය සංශෝධන ගෙන ඒමද සිදු කෙරේ. | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) යන ආයතන දෙකම ආවරණය වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය මගින් හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතුය. |

- ඒ හැරුණු කොට, ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය, ආයතනික, මෙහෙයුම් හා මූල්‍යමය වශයෙන් වැදගත් තීරණ ගැනීමේදී කමිටුවක් හරහා එම තීරණවලට එළඹෙනුයේ නම් කමිටු නියෝජනය සඳහා අමාත්‍යාංශයේ නිලධාරින් සහභාගීත්වය දරනු ලැබීම ද සිදු වේ.

- ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) ආයතනය සෘජු අධීක්ෂණයක් සිදු කිරීමට අමාත්‍යාංශයට නොහැකි වුවද නියාමන කාර්යයන් පමණක් සිදු කරනු ලැබේ.

- නැව් තෙල් ගබඩා වෙළඳාම (බන්කරින්) සඳහා බලපත්‍ර ලබා දෙන අතර ඒ සමඟ නැව් තෙල් ගබඩා වෙළඳාම මගින් වෙළඳාමට අදාළ කොන්දේසි පනවන අතර එම කොන්දේසි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ලැබේ.

- ඛනිජ තෙල් පිරවුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ කොන්දේසි CPC ආයතනය විසින් නිකුත් කරනු ලබන අතර, අහඹු ලෙස තෝරාගත් පිරවුම්හල් පරීක්ෂා කිරීම් කටයුතු වලදී LIOC පිරවුම්හල් ද පරීක්ෂා කෙරේ.

(ආ) භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේ ම අවධානය යොමු වී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය වන ත්‍රිකුණාමලය වරාය තුළ 1930 වර්ෂයේ සිට ස්ථාපිත කර ඇති තෙල් ටැංකි පද්ධතිය ඝණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. දැනට පවතින මුළු ටැංකි 99 කින් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය සඳහා මින් පෙර ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීමට එරෙහිව අධිකරණයේ නඩු පැවරීම හේතුවෙන් එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර පසුව මෙම ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඉන්දීය රජය සමඟ පැවති රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා 2021 වර්ෂයේ අවසන් භාගය තුළ අවසන් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් ටැංකි 14 ක් ලංකා ඉන්දියන් තෙල් සමාගම වෙත ද, තෙල් ටැංකි 24 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ද, සහ ටැංකි 61 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඉන්දියන් තෙල් සමාගම හා ඒකාබද්ධව පිහිටුවන ලද Trinco

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා පුනරුත්ථාපනය සිදුකර භාවිතයට ගැනීම කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| | දින ආරම්භ කර තිබුණ ද, ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකර භාවිතයට ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද, තෙල් ටැංකි සංකීර්ණයේ සංවර්ධන කටයුතුවලට අදාළව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) එක්ව Trinco Petroleum Terminal (Pvt) Ltd නමින් ඒකාබද්ධ සමාගමක් පිහිටවා තිබුණද ඊට අදාලව සංවර්ධන සැලස්මක් හෝ මේ දක්වා සකස්කර නොතිබුණි. | Petroleum Terminal (Pvt) Ltd ආයතනය වෙතද, සංවර්ධනය කිරීම සඳහා බදු දෙන ලදී. Trinco Petroleum Terminal (Pvt) Ltd ආයතනය 2021 වර්ෂයේ දෙසැම්බර් මස 24 දින සංස්ථාපනය කරන ලද ආයතනයක් වේ. මෙම කෙටි කාලය තුළ ආයතනය සඳහා අවශ්‍ය පාලක මණ්ඩලය සහ සේවක මණ්ඩලය බඳවා ගෙන එම ආයතනය වෙත පවරන ලද තෙල් ටැංකි 61 සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරමින් පවතින අතර මනා අධ්‍යයනයකින් පසු ඉදිරි කාලය තුළ විස්තරාත්මක සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් තිබේ. | |
| (ඇ) | සපුගස්කන්දේ තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීමට මෙන්ම දේශීය අවශ්‍යතාවය සලකා නව පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් 2011 වර්ෂයේදී විද්වත් කමිටුවක් විසින් සඛ්‍යතා අධ්‍යන වාර්තා ලබාදී තිබුණද තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීමට හෝ නව පිරිපහදුවක් ස්ථාපිත කිරීමට මේ දක්වා නොහැකිවී තිබේ. | සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය, පුළුල් කිරීම සහ නව පිරිපහදුවක් ඉදිකිරීම සම්බන්ධයෙන් 2011 වර්ෂයේ දී ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඇති අතර වර්තමානය වන විට තාක්ෂණික හා ආර්ථික කරුණුවල කාලීන වෙනස්වීම හේතුවෙන් එය පදනම් කර ගනිමින් නව ශක්‍යතා අධ්‍යයනයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කර පහත වාර්තා ලබා දී ඇත.<br>(i) ශක්‍යතා අධ්‍යයන වාර්තාව (Feasibility report) යෝජනා කැඳවීමේ කෙටුම්පත (Draft RFP document)<br>(ii) Configuration report<br>(iii) වෙළඳපොළ සමීක්ෂණ වාර්තාව (Market survey report)<br><br>ඒ අනුව, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය ආයෝජකයකු සොයා ගැනීමට යෝජනා කැඳවීමේ අවස්ථාවේ පවතින අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | සපුගස්කන්දේ තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීමට මෙන්ම දේශීය අවශ්‍යතාවය සලකා නව පිරිපහදුවක් ස්ථාපිත කිරීම සඳහා වූ යෝජනා ප්‍රයෝගිකව ඉටුකළ යුතුවීම. |
| (ඈ) | කන්කසන්තුරේ පිහිටි ඉන්ධන තොග ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙසට 2011 වර්ෂයේදී සිමෙන්ති සංස්ථාව විසින් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) වෙත දන්වා තිබූ දින සිට මේ දක්වා උතුරු | කන්කසන්තතුරේ ඉන්ධන තොග ගබඩා සංකීර්ණය පිහිටුවීම සඳහා අවශ්‍ය ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් ඇතිව තිබූ ගැටලුකාරී තත්ත්වය විසඳාගෙන එම ඉඩම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත පවරා ගෙන පසුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත බදු පදනම | උතුරු පළාත සඳහා තොග ගබඩාවක් ස්ථාපිත කිරීමට හෝ පවතින තොග ගබඩාව නවීකරණය හා පුළුල් කිරීම සිදු කර පවත්වාගෙන යාමට |

| | | | |
|---|---|---|---|
| | පළාත සඳහා තොග ගබඩාවක් ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. තවද, 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සුදුසු ඉඩමක් සොයා ගන්නා තෙක් පවතින තොග ගබඩාවම නවීකරණය හා පුළුල් කිරීම සිදු කර පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලැබී තිබුණද මේ දක්වා එම ව්‍යාපෘතිය ඉටු කිරීමටද නොහැකි වී තිබුණි. | වෙත ලබාදීමට කටයුතු කර ඇත. තොග ගබඩා සංකීර්ණය පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික සැලසුම් (Drawings) ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සකස් කර ඇති අතර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ අදාළ ඉඩමට ප්‍රවේශය සහතික කිරීම පිණිස දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ සාකච්ඡා ආරම්භ කර ඇත. | කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2008 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ස්ථාපිත කරන ලද පොලිප්ටෝ ලංකා සමාගම ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවති. මෙහි කර්මාන්ත ශාලාව හොරණ ප්‍රදේශයේ පිහිටුවා ඇති අතර ප්ලාස්ටික්, පොලිතින් ඝන අපද්‍රව්‍ය යොදාගෙන ඉන්ධන නිපදවීම මෙහි ප්‍රධාන කාර්ය වේ. අමාත්‍යාංශයට සියයට 60 ක්, නිමැවුම්කරුට සියයට 30 ක් හා මොරටුව විශ්වවිද්‍යාලයේ ඛනිජ සම්පත් පර්යේෂණ පීඨයට සියයට 10 ක් වශයෙන් මෙම සමාගමේ හිමිකාරත්වය බෙදී ගොස් ඇත. මෙම සමාගම දැනට අක්‍රීය තත්ත්වයේ පවතින අතර, රජය මගින් ලබාදී ඇති රු. මිලියන 80 කට අධික වත්කම් හා අනෙකුත් පහසුකම් මෙන්ම අදාල ආයෝජකයාගේ ආයෝජනයද නිසි ප්‍රතිඵලයක් නොමැති අනාර්ථික ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය කෙරේ. එසේම, මෙම සමාගම සක්‍රීය කර ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයට කිසිඳු විධිමත් වැඩපිළිවෙලක් පවතින බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2009 පෙබරවාරි 19 දිනැතිව මධ්‍යම පරිසර අධිකාරිය සහ ආනන්ද විතානගේ මහතා සමඟ ඇති කර ගත් ඒකාබද්ධ ගිවිසුම සහ එහි 12.3 වගන්තිය අනුව සංශෝධන ඇතුළත්ව 2009.12.08 දිනැතිව මධ්‍යම පරිසර අධිකාරිය, ආනන්ද විතානගේ මහතා සහ පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම සමඟ අත්සන් තබන ලද ඒකාබද්ධ ගිවිසුම අනුව පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම පිහිටුවා ඇත. පසුව ඛනිජ තෙල් විෂය භාර අමාත්‍යාංශයේ විෂය පථය යටතට ඇතුළත් කර ඇත. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ආරම්භයේදී අරමුදල් සැපයීමට රජය තීරණය කළද, භාණ්ඩාගාරය වෙතින් මෙම ව්‍යාපෘතිය සඳහා වැඩිමනත් අරමුදල් යෙදවීම අසීරුවීමෙන් සමාගම පවත්වාගන යාමට නොහැකි තත්ත්වයට පත් වූ බැවින්, 2018.08.21 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2018.09.26 දින ආයතනය ප්‍රතිව්‍යුහගත කරන ලදි. ඒ අනුව, වර්තමානයේ එම ආයතනයේ අයිතියෙන් 60% ක අයිතියක් මෙම අමාත්‍යාංශයට නොමැති අතර එම ආයතනය සතුව පැවති රුපියල් මිලියන 80 ක් පමණ වන වත්කම් එම ආයතනය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ආයෝජකයා වෙත 2018.09.26 දිනැති ගිවිසුම මත පවරා ඇති අතර එම වටිනාකම නැවත රජය වෙත අය කර ගැනීමට නියමිතය. මෙහෙයුම් හා නඩත්තු ගිවිසුම අනුව පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම ආයතනය ක්‍රියාත්මක කර පවත්වාගෙන යාමේ ඍජු වගකීම මෙම අමාත්‍යාංශය වෙත නොමැති අතර එම | පොලිප්ටෝ ලංකා සමාගම සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස්කර ක්‍රියත්මක කිරීම හා රජය විසින් දරන ලද පිරිවැයේ ඵලදායීතාවය තහවුරු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | ආයතනය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම පමණක් සිදු කළ යුතුය. මේ වන විට පරිසර අධිකාරිය වෙතින් එම ආයතනය වෙත ලබා දිය යුතු උපලේඛණගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් දැනට අක්‍රිය තත්ත්වයේ පවතී. එම බලපත්‍රය පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම වෙත ලබා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය හා පරිසර අධිකාරිය වෙත අවශ්‍ය නිර්දේශ මෙම අමාත්‍යාංශය විසින් ලබා දී ඇත. |

## 3.2 නියාමන කාර්යභාරයන් විධිමත්ව ඉටු නොකිරීම

### 3.2.1 නැව් තෙල් හා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක DEVF/6/1/23(II) හා 2022 පෙබරවාරි 15 දිනැති ලිපිය හා උපලේඛණය 1 හි 07 අනුව නැව්තෙල් වෙළඳාම සඳහා ලිඛිත අධිකාරිය ලත් පුද්ගලයන් විසින් තම මාසික නැව්තෙල් කටයුතු පිළිබඳ ප්‍රකාශයක් ඊළඟ මාසයේ 18 දින හෝ ඊට පෙර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද, 2021 වර්ෂයේ දී ලිඛිත අධිකාරිය ලත් සමාගම් 13ක් විසින් විධිමත් පරිදි මාසික නැව්තෙල් කටයුතු පිළිබඳ වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර, ඒ අතුරින් සමාගම් 05 ක් කිසිඳු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එසේම නියමිත දිනට වාර්තා ඉදිරිපත් නොකළ ආයතන 08 කට අදාළව අයකර ගත යුතුව තිබූ රු. 180,000 කට වැඩි ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. තවද, නියමිත පරිදි වාර්තා ඉදිරිපත් නොකළ ආයතනවලට එරෙහිව අමාත්‍යාංශය විසින් මේ දක්වා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නැව් තෙල් වෙළෙඳාමේ නිරත ආයතන විසින් පසුගිය කාලයේ රට තුළ පැවති කෝවිඩ් 19 තත්ත්වය හේතුවෙන් නියමිත පරිදි වාර්තා ඉදිරිපත් නොකළ ලද අතර නියමිත පරිදි වාර්තා ඉදිරිපත් කරන ලෙස එම ආයතනය වෙත දැනුම් දී ඇත. එම ආයතන වෙතින් අයකර ගත යුතුව තිබූ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට සියළු ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | මාසික නැව්තෙල් කටයුතු පිළිබඳ වාර්තා අප්‍රමාදව අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට හා ඒවා විධිමත්ව ඇගයීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාද ගාස්තු අයකර ගැනීම ප්‍රමාදයකින් තොරව සිදුකල යුතුවීම. නියමිත පරිදි වාර්තා ඉදිරිපත් නොකළ ආයතනවලට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

### 3.3 තාර ආනයනය හා නියාමනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 පෙබරවාරි 07 දිනැති අංක 2018/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව තාර ආනයනකරුවන් විසින් තාර ආනයනයට අදාළව කාර්තුමය වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020 හා 2021 වර්ෂවලට අදාළව ආනයනකරුවන්ගෙන් කාර්තුමය වාර්තා ලබාගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. එසේම වාර්තා ඉදිරිපත්නොකළ ආයතන සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තාර ආනයනකරුවන් වෙතින් තාර ආනයනයට අදාළව කාර්තුමය වාර්තා අමාත්‍යාංශය විසින් ලබා නොගත් අතර එම තොරතුරු අවශ්‍ය වූ අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා රේගුව වෙතින් ලබා ගන්නා ලදී. කෙසේ වෙතත් ඉදිරියට එම තොරතුරු තාර ආනයනකරුවන්ගෙන් සෘජුවම ලබා ගැනීමට කටයුතු කරයි. | තාර ආනයනකරුවන්ගෙන් කාර්තුමය වාර්තා ලබාගැනීමට හා ඒවා විධිමත්ව ඇගයීමට කටයුතු කළ යුතුය . |

### 3.4 ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රමිතීන් හා නියාමනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඛනිජ තෙල් ආශ්‍රිත පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල් සඳහා ප්‍රමිත ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය මගින් සකස් කර තිබුණද, ශ්‍රී ලංකාව තුළ එම ප්‍රමිත අනුගමනය කිරීම අනිවාර්ය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සෑදීමට අමාත්‍යාංශය මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකාව තුළ මේ දක්වා එම ඉන්ධන වල ප්‍රමිතීන් පරීක්ෂා කිරීමේ බලයලත් ආයතනයක් ස්ථාපිත කර නොමැති අතර ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැකසීමට අමාත්‍යාංශය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | ඛනිජ තෙල් ආශ්‍රිත පෙට්‍රල්, ඩීසල් හා භූමි තෙල් සඳහා ප්‍රමිති ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් සකස් කර තිබුණ ද ඛනිජ තෙල් නිෂ්පාදන පිරිපහදු කිරීම ගබඩා කිරීම, බෙදාහැරීම සඳහා රට තුළ පවතින යටිතල පහසුකම්හි තත්ත්වය හා ඛනිජ තෙල් නිෂ්පාදන භාවිතා කරනු ලබන උපකරණවල තත්ත්වය සැලකිල්ලට ගෙන එම සියළු ප්‍රමිතීන් ශ්‍රී ලංකාව තුළ අනුගමනය කිරීම අනිවාර්ය කිරීමේ හැකියාවක් මෙම අමාත්‍යාංශය සතුව නොමැත. කාලීන අවශ්‍යතාවය හා හැකියාව සැලකිල්ලට ගෙන පසුගිය වසර කිහිපය තුළ මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදනවල ප්‍රමිතීන් යාවත්කාලීන කරන ලදී. තවද, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා නව ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මෙම අමාත්‍යාංශය හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් පත් කරන ලද කමිටුවක් | ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රමිතීන් හා නියාමනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මගින් අධ්‍යයනය කරනු ලබන අතර ඒ සඳහා ප්‍රමිතීන් හඳුන්වා දීම මෙම අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ. | |
| (ආ) | 2016 අගෝස්තු 31 දිනැති හා අංක අමය/16/1576/19/06 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඛනිජ තෙල් අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධ යෝජනාවක් පරිදි මහජන උපයෝගිතා කොමිසමේ නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවයක් මගින් ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳව රසායනාගාර පරීක්ෂණ සිදු කළ හැකි අති නවීන හා අංග සම්පූර්ණ ඛනිජ තෙල් පර්යේෂණාගාරයක් කාර්මික තාක්ෂණ ආයතනයෙහි ස්ථාපිත කර තිබේ. එසේ වුවද, මේ දක්වා එකී තාක්ෂණික සහය ලබා ගැනීමට හෝ එම ආයතනය සමඟ එකඟතාවයකට හෝ අවබෝධතා ගිවිසුමකට හෝ එළඹීමට අමාත්‍යාංශය කටයුතු කර ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව, ස්වාධීන තෙවන පාර්ශවයක් මගින් ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳව රසායනාගාර පරීක්ෂණ සිදුකරවා ගැනීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු නොකිරීම නිසා ඛනිජ තෙල් පර්යේෂණාගාරය දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පවතී. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මෙරටට ආනයනය කරනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදනවල රසායනාගාර පරීක්ෂණ ISO 17025 (අනුමාපන සහ පරීක්ෂණ ප්‍රතිඵල සඳහා තාක්ෂණික වශයෙන් ජාත්‍යන්තරව පිළිගත් නිපුණතා තත්ත්ව සහතිකය) ප්‍රතීතනය හිමි ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත රසායනාගාරය මඟින් සිදු කරනු ලබයි. ඉන්ධන නැව්තොග වල රසායනාගාර පරීක්ෂාව විශේෂඥ කාර්ය මණ්ඩලයක තත්කාලීන කාර්යයක් වන බැවින් නැව් තොගයක් පැමිණි පසු පරීක්ෂාවන් සඳහා සහභාගී විය හැකි කැපවූ රසායනාගාර සේවකයින් සිටිය යුතු වේ. නැව් ගත කිරීම් පිළිබඳ විස්තර CPSTL සහ CPC ආයතන සතුව ඇති බැවින්ද, ISO 17025 ප්‍රතීතනයලත් CPSTL රසායනාගාරය ආනයනය කිරීමේ රසායනාගාර නියදි පරීක්ෂා කිරීම වඩාත් යෝග්‍ය වේ. පළමු අවස්ථාවේදී ප්‍රතික්ෂේප වූ විට හෝ නැව් ගත කිරීම සඳහා දෙවන නියැදියක් හෝ නැවත පරීක්ෂා කිරීමකදී, රට තුළ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා සම්පූර්ණ ලෙසම ස්වාධීන ISO 17025 ප්‍රතීතනය ලත් පරීක්ෂණාගාරයක් තිබීම වැදගත් හා වාසිදායක වන අතර එවැනි අවස්ථා වලදී මෙම රසායනාගාරයේ සේවය ලබා ගත හැකිය. රසායනාගාරයේ පහසුකම ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනකරුවන් විසින් ඔවුන්ගේ රසායනාගාර පරීක්ෂණ සිදු කර ගැනීම සඳහා බහුලව භාවිතා කරයි. | තුන්වන පාර්ශවයක් මගින් තාක්ෂණික සහය ලබා ගැනීමට ඇති හැකියාව කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කිරීම හා රජයේ ආයතනයක යොදවන ආයෝජනය ඵලදායීව උපයෝජනය කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඇ) | එක් එක් ඛනිජතෙල් නිෂ්පාදනය සඳහා රටේ පවතින ඉල්ලුම් තත්ත්වය, විනිමය අවශ්‍යතාවයන්, රටේ අනෙකුත් ආනයන හා නිෂ්පාදන ප්‍රමුඛතාවන් ආදිය පිළිබඳව විධිමත් හා අනෙකුත් ආයතන සමග අන්තර් සම්බන්ධතාවයකින් යුතුව කාලීනව තොරතුරු ගලා | එක් එක් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා රටේ පවතින ඉල්ලුම් තත්ත්වය, විනිමය අවශ්‍යතාවයන්, නිෂ්පාදන ප්‍රමුඛතාවයන් ආදිය පිළිබඳව කාලීන තොරතුරු පදනම්ව රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවය වාර්ෂිකව ඇස්තමේන්තු කරනු ලබන අතර එම තොරතුරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන්, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ නිලධාරීන්, | එක් එක් ඛනිජතෙල් නිෂ්පාදනය සඳහා සියළු ක්ෂේත්‍රයන්හි පවතින ඉන්ධන ඉල්ලුම අඛණ්ඩව සපුරාලීම සඳහා සුදුසු පියවර ගැනීමත්, ඒ සඳහා රාජ්‍ය ආයතන සමග අන්තර් සම්බන්ධතාවයක් |

| | | |
|---|---|---|
| එන සහ ඒ මත ඇගයීම් සිදු කිරීමට හැකි තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශය තුළ ඇති බවට තහවුරු නොවුණි. ඒ අනුව, රටේ අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට ප්‍රමුඛතාවයන් හඳුනාගෙන ඒ ඒ ක්ෂේත්‍ර සඳහා අනුමැතීන් ලබාදීම සහ නියාමන කටයුතු සිදු කරනවාද යන්න ගැටළු සහගත වේ. | ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්, ලංකා ඉන්දීය තෙල් සමාගමේ නිලධාරීන් සහ මෙම අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත තොග කමිටුවක් මඟින් යාවත්කාලීන කරනු ලැබේ. තවද, 2021 වර්ෂය අවසානය දක්වා සියළු ක්ෂේත්‍රයන්හි ඉන්ධන ඉල්ලුම අඛණ්ඩව සපුරාලීම සඳහා කටයුතු කරන ලද අතර වර්තමානයේ පවත්නා විදේශ විනිමය ගැටළු හේතුවෙන් ප්‍රමුඛතාවය අනුව ඉන්ධන ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. | පවත්වා ගනිමින් කාලීන තොරතුරු හුවමාරු කර ගත හැකි තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමත් අවශ්‍ය වේ. |

### 3.5 විශේෂ ව්‍යාපෘති කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 වසරේ දී සිදුකරන ලද ජාත්‍යන්තර ලංසු කැඳවීම අනුව මණ්නාරම් ද්‍රෝණියේ M2 ගවේෂණ බිම් කොටසේ ඛනිජ තෙල් ගවේෂණ කටයුතු සඳහා තෝරාගත් කෙයාර්න් ලංකා පුද්ගලික සමාගම 2011 දී සිදුකරන ලද කැනීම් අනුව ස්වභාවික වායු නිධි දෙකක් ඇති බවට සොයා ගෙන තිබුණි. මෙම සමාගම මණ්නාරම් ද්‍රෝණියේ පර්යේෂණ කටයුතු අතරමග නවතා 2015 ඔක්තෝබර් 15 දින ගිවිසුම අවසන් කර තිබුණි. තවද, මෙහි ගවේෂණ කටයුතු සහ ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂයේ දී ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් IHG Global සමාගම තෝරාගෙන 2016 දෙසැම්බර් සිට 2018 අගෝස්තු දක්වා අළෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා ඇ.ඩො. 300,000 ක් එනම් එවකට පැවති විනිමය අනුපාත අනුව රු. 46,610,853 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, මෙම බිම් කොටසේ ගවේශණ කටයුතු සිදුකිරීමට හෝ | අයි එච් එස් ගෝබල් සමාගමේ (IHS Global) සහාය සහ මඟපෙන්වීම යටතේ 2017 වසරේ එම්2 (M2) ගවේෂණ බිම් කොටසේ පිහිටි ස්වභාවික වායු නිධි සංවර්ධනය කිරීම සඳහා අභිලාෂ දැක්වීමේ ප්‍රකාශයන් (Expression of Interest) කැඳවන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ හූස්ටන් (Houston) ජනපදයේ සහ එක්සත් රාජධානියේ ලන්ඩන් නගරවලදී මේ සඳහා අළෙවිකරණ ප්‍රවර්ධන සාකච්ඡා ආයෝජකයන් සමඟ පවත්වන ලදී. මෙහිදී මෙම ස්වභාවික වායු නිධි සංවර්ධනය කිරීමට කැමැත්ත ප්‍රකාශ කළ සෑම ආයෝජකයෙක්ම නිෂ්පාදිත ස්වාභාවික වායු විවිධ ආංශික පරිභෝජනය (Sectoral Consumption) සඳහා රාජ්‍ය කැපවීමක් අපේක්ෂා කළ නමුත් එවකට ලංකාවේ එවැනි ස්වාභාවික වායු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීය. එබැවින්, ඛනිජ තෙල් සම්පත් ලේකම් කාර්යාලයේ මාර්ගෝපදේශකත්වය යටතේ 2017 වසරේ සිට ස්වාභාවික වායු සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට කටයුතු කරන ලදී. මෙම ජාතික ස්වාභාවික වායු ප්‍රතිපත්තිය 2020 ඔක්තෝම්බර් මාසයේ දී එළිදක්වන ලදී. | මණ්නාරම් ද්‍රෝණියේ M2 ගවේෂණ බිම් කොටසේ ඛනිජ තෙල් ගවේෂණ කටයුතු සිදුකිරීමට හෝ හඳුනාගත් නිධි දෙකෙහි ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගත් නිධි දෙකෙහි ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස්කිරීමට අමාත්‍යාංශය මේ දක්වා අපොහොසත් වී තිබේ. | තවද, 2019 වසරේ මෙම වායු සංවර්ධනය කිරීම සඳහා කුඩා ලංසු වටයක් කැඳවන ලදී. එනමුදු, මේ සඳහා සුදුසු මෙහෙයුම්කරුවෙකු තෝරාගැනීමට නොහැකි වූ අතර නව ඛනිජ සම්පත් පනත යටතේ නැවත සුදුසු ආයෝජකයෙකු තෝරාගැනීමේ කටයුතු අරඹා ඇත. | |
| (ආ) | 2012 වර්ෂයේ දී ආරම්භ කර තිබූ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන් ගතව සිදුකරන ගුරුත්ව හා චුම්බක සමීක්ෂණ මගින් දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය කඩිනම්ව නිම කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍යාංශය අසමත් වී තිබූ අතර, 2019 අගෝස්තු 15 වන දින Bell Geospace සමාගම සමග එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව එහි කටයුතු 2020 වර්ෂය තුළ අවසන් විය යුතුව තිබුණි. එසේ වුවද, මේ දක්වා එම කටයුතු අවසන් කර ඇති බවට තහවුරු සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2019 අත්සන් කරන ලද මෙම ගිවිසුම ප්‍රකාරව දින 180ක් ඇතුළත පූර්ව කැපවීම් (Pre-Commitment) තහවුරු කරගෙන දත්ත රැස් කිරීමට බෙල්ජියෝස්පේස් (Bell Geospace) සමාගමට අනුමැතිය ලබා දෙන ලදි. නමුත් කොරෝනා (Covid) වසංගතයේ බලපෑමෙන් මෙම සමාගමට පූර්ණ කැපවීමකින් යුතුව මෙම දත්ත රැස් කිරීමේ ගවේෂණ කටයුතු 2020 වසර තුළ සිදු කිරීමට නොහැකි විය. පසුව අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ 2021 වසර දක්වා මෙම දත්ත රැස් කිරීම දීර්ඝ කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය Bell Geospace සමාගමට ලබා දෙන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම සමාගම 2021 වසරේ අගෝස්තු සිට දෙසැම්බර් කාලය තුළ අදියර දෙකක් යටතේ ශ්‍රී ලංකා ගුවන් සීමාව තුළ M1,M2,C1 සහ C2 ගවේෂණ බිම් කොටස් ආවරණය කරමින් ගුවන් ගත ගුරුත්වාකර්ෂණ / චුම්භක දත්ත 17,000 line Km පමණ රැස් කර ගන්නා ලදි. මෙම දත්ත දැනටමත් විශ්ලේෂණ ක්‍රියාවලීන් (Data Processing) වලට භාජනය කර ඇති අතර අලෙවි සහ ප්‍රවර්ධන කටයුතු කරමින් පවතී. | මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන් ගතව සිදුකරන ගුරුත්ව හා චුම්බක සමීක්ෂණ මගින් දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය කඩිනම්ව නිම කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍යාංශය පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කර ගෙන දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය හා නාරා ආයතනය අතර 2015 සැප්තැම්බර් 30 දින ගිවිසුමකට එළඹ 2018 සැප්තැම්බර් 28 දින වන විට ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත් මිල වූ | ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ තොරතුරු තාක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සුදුසුකම් සහිත නිලධාරීන් නොමැති වීම හේතුවෙන් මෙම දත්ත ඇතුලත් වෙබ් සර්වර් (Web Server) යන්ත්‍රය ජාතික ජල සම්පත් නියෝජිතායතනයේ (NARA) ආයතනයේ ස්ථාපිත කරන ලදි. ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන | දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා දත්ත පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව තොරතුරු පද්ධතිය මෙහෙයවිය හැකි |

| | | |
|---|---|---|
| රු. 37,165,283 ක් නාරා ආයතනය වෙත ගෙවා තිබුණි. එසේ වුවද, දත්ත පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව තොරතුරු පද්ධතිය මෙහෙයවිය හැකි පුහුණු නිලධාරීන් නොමැති වීම සහ අවශ්‍ය යටිතළ පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම දත්ත ඇතුළත් වෙබ් සර්වර් යන්ත්‍රය ස්ථාපිත කර විධිමත්ව උපයෝජනය කර ගැනීමට මේ දක්වා නොහැකි වී තිබුණි. | අධිකාරියේ අධීක්ෂණය යටතේ NARA ආයතනය මෙම අන්තර්ජාල දත්ත ගබඩාව යාවත්කාලීන කරන අතර ඕනෑම ආයෝජකයෙකුට මෙම දත්ත අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කිරීමට හැකියාව ඇත. | පුහුණු නිලධාරීන් බඳවා ගැනීම සහ අවශ්‍ය යටිතළ පහසුකම් සංවර්ධනය කිරීම කළ යුතුය. |

**3.6 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් හා ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

විගණනයට ඉදිරිපත්කර ඇති තොරතුරු අනුව බලශක්ති අමාත්‍යාංශයේ 2021 වර්ෂයට අදාළව ව්‍යාපෘති 52 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පලාලි ගුවන් තොටුපළ කලාපීය ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 575ක් ඇස්තමේන්තු කර තිබුණි. 2019 ජුනි 06 දිනැති අංක 18/1229 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ව්‍යාපෘතිය 2020 දෙවන කාර්තුව අවසානයේ දී පර්යන්තය ඉදිකිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂාකර තිබූ අතර, 2021 වර්ෂයේදී ICB ක්‍රියාවලියට අනුව ලංසු කැඳවීම හා කොන්ත්‍රාත්තු ප්‍රදානය, ප්‍රධාන උපකරණ (ගබඩා ටැංකි සහ බෙදා හැරීමේ මොඩියුල, ඉන්ධන පිරවුම්හල් ආදිය) ආනයනය කිරීම හා ස්ථාපනය කිරීම සිදුකිරීමට නියමිතව තිබුණි. එසේ වුවද, 2021 වර්ෂයේ මෙම කාර්යයන් ඉටුකර නොතිබූ අතර සමස්ථ ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 3 ක් පමණ වී තිබුණි. | පලාලි ගුවන් තොටුපළ තුළ ගුවන්යානා ඉන්ධන සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර පසුගිය වසර දෙක තුළ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය මත බලපාන ලද කරුණු හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරණය විසින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට පියවර ගත් නමුත් 2022 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සාධ්‍යතාවය අධ්‍යනය කර කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොළඹ වරායේ ගබඩා ඉදිකිරීම සඳහා රු. මිලියන 75 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, ඒ සඳහා 2021 වර්ෂයට අදාළව රු. මිලියන 39 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ ඉදිකිරීම් කටයුතු වලින් සියයට 40 ක් සම්පූර්ණ කිරීමට ඉලක්කගත කර තිබුණද, | කොළඹ වරාය අධිකාරිය භූමිය තුළ ඉදිකරනු ලබන බැවින් ඒ සඳහා වරාය අධිකාරියේ අවසරය ලබා ගත යුතුය. එම අවසරය ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නියමිත කාලය තුළ ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සාධ්‍යතාවය අධ්‍යනය කර කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය මේ දක්වා ආරම්භකර නොතිබුණි. | | |
| (ඇ) | කෙරවලපිටිය වෙරළ තීරයේ සිට කෙරවලපිටිය සහ කැලණිතිස්ස බලාගාර දක්වා කිලෝමීටර 5 ක් පමණ දුරින් පිහිටි පාවෙන ගබඩා ප්‍රතිනිර්මාණය කිරීමේ ඒකකයේ (FSRU) සිට ප්‍රති වායුකෘත ද්‍රව ස්වභාවික වායු (R-LNG) නල මාර්ගයක් ඉදිකිරීම සඳහා ඩොලර් මිලියන හතළිහකක් (40) ඇස්තමේන්තු කර තිබුණි. 2021 වර්ෂයේදී මෙහි සියයට 5 ට අඩු ප්‍රගතියක් තිබූ බව වාර්තා කර තිබුණි. | කෙරවලපිටිය වෙරළ තීරයේ සිට කෙරවලපිටිය සහ කැලණිතිස්ස බලාගාරය දක්වා ද්‍රවීකෘත ස්වභාවික වායු ප්‍රවාහන නල මාර්ග ඉදි කිරීම සඳහා යෝජනා කැඳවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කරන ලද අතර ඒ සඳහා ලද යෝජනා ඇගයීම 2021 වර්ෂය තුළදී සිදුකරන ලදී. වර්ෂය පුරාවට පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද ව්‍යාපෘතිය අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගෙන ඇත. | ව්‍යාපෘතිය කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති අංක 2035 - SOREM ව්‍යාපෘතිය සඳහා ඉතිරි ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 500 ක් ඇස්තමේන්තු කර තිබුණද, ඉඩම් අත්පත්කර ගැනීමට අදාළව පැනනැගී ඇති නීතිමය ගැටලු මේ දක්වා නිරාකරණය කර නොතිබූ අතර ව්‍යාපෘතියද ආරම්භකර නොතිබුණි. | SOREM ව්‍යාපෘතිය සඳහා ඉතිරි ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. මි. 500 ක් ඇස්තමේන්ත කර තිබුණද මෙම ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් පවතින නීතිමය ගැටළු නිරාකරණය කිරීමෙන් පසු බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම අත්පත් කරගැනීමේ කටයුතු අවසන් කළ යුතුය. එම ගැටළු නිරාකරණයෙන් පසු මෙම මුදල් අදාළ පාර්ශ්ව වෙත ගෙවීමට හැකියාව ලැබෙනු ඇති අතර මෙම අත්පත් කර ගැනීම කඩිනම් කිරීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව කටයුතු කරමින් පවතී. | - එම - |
| (ඉ) | ව්‍යාපෘති අංක 2036 - මාබිම මාර්ගය නැවත සකස් කිරීම සඳහා රු. මිලියන 250 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, ඊට අදාළ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය මේ දක්වා ආරම්භකර නොතිබුණි. | මෙම මාර්ගය නැවත සකස් කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබන අතර ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සබ්‍යතාවය අධ්‍යානය කර විධිමත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කොලොන්නාව තොග ගබඩා පර්යන්තයේ ඉදිකරනු ලබන ඝන මීටර් 93,000 ක ධාරිතාවයකින් යුතු තෙල් ටැංකි 9 ව්‍යාපෘතිය 2022 වර්ෂය හා 2023 වර්ෂවලදී නිමකර භාවිතයට ගත යුතුව තිබුණද, මේ වනවිට එම | කොලොන්නාව පර්යන්තයේ ඉදිකරනු ලබන ඝණ මීටර් 93,000 ක සමස්ථ ධාරිතාවයකින් යුතු ටැංකි 9 ව්‍යාපෘතිය අදියර දෙකකින් යුක්ත වන අතර, ඝණ මීටර් 29,000 න් යුතු ටැංකි 03 අදියරෙහි ඉදිකිරීම් අවසන් මට්ටමේ පවතින අතර | නිශ්චිත කාල රාමුවක් තුළදී වැඩ නිම කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |

| | |
|---|---|
| ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පවතින බවත්, ඇතම් ඉදිකිරීම් කටයුතු අතරමග නතරකර දමා ඇති බවත්, ඒ අනුව අපේක්ෂිත කාල රාමුව තුළදී වැඩ නිම කිරීම දුෂ්කර බවත් නිරීක්ෂණය කෙරේ. | ඉතිරි ටැංකි 06 ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් අත්හිටවා ඇත. ඒ සඳහා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් නීතිමය පියවර ගනිමින් සිටී. |

**3.7 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අවම වශයෙන් වසර 4 ක කාලයක් ඉක්මවූ කපා නොහල ඉදිරියට ගෙන යන ලද පාඩු හා අත්හැරීම් වශයෙන් එකතුව රු, 1,064,226 ක් වූ රිය අනතුරු 17ක් වාර්තා කර තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර පාඩුව ආපසු අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට හෝ කටයුතු කර නොතිබුණි. | 2021.12.31 දින වනවිට කපා නොහළ ඉදිරියට ගෙන යන ලද පාඩු හා අත්හැරීම් එකතුව රු.1,064,226 ක් වුවද අද දින වන විට රිය අනතුරු 04 ක අලාභය වන රු.103,635.77 ක් කපා හැර ඇත. තවද, වාහන අනතුරු 02 ක් සම්බන්ධව අලාභය වන රු.152,844.37 ක් කපා හැරීම සඳහා අදාල අධිකාරීන් වෙත ඉදිරිපත් කර ඇත. WPPE-9461 දරණ වාහන අනතුර වෙනුවෙන් රු. 23,352.24 අදාල පාර්ශවයෙන් අයකරගැනීමට කටයුතු කරමින් පවතී. එම කටයුතු හැරුනුවිට ඉතිරි මුළු අලාභය වන රු. 784,393.62 කපාහැරීම සම්බන්ධයෙන් දැනටමත් කඩිනමින් කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර පාඩුව ආපසු අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට පියවර ගත යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයට සෘජුවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණ ලෙස “දැරිය හැකි පිවිතුරු බලශක්තිය” හඳුනාගෙන තිබුණද එම තිරසර සංවර්ධන අරමුණ ඉටුවන ආකාරයට කිසිඳු ව්‍යාපෘතියක් සැලසුම් කර හෝ ක්‍රියාත්මක කර ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.<br>අමාත්‍යාංශය විසින් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර, අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය | අමාත්‍යාංශයට සෘජුවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණ ලෙස “දැරිය හැකි පිවිතුරු බලශක්තිය” හඳුනාගෙන ඇති අතර එම තිරසර සංවර්ධන අරමුණ ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.<br><br>• ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදනය සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වා දීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව එක්ව Floating Storage Regasification Unit, Mooring System සහ Pipeline යන අංගවලින් යුත් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, එම ව්‍යාපෘතියෙහි කෙරවලපිටිය ප්‍රතිවායුකරන ඒකකයේ සිට | තිරසර සංවර්ධන අරමුණ වන “දැරිය හැකි පිවිතුරු බලශක්තිය” හඳුනාගෙන එම අරමුණ ඉටුවන ආකාරයට ව්‍යාපෘතියක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක |

| | | |
|---|---|---|
| මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අදාළ කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | කැළණිතිස්ස විදුලි බලාගාරය දක්වා වන නළ මාර්ගය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියාවට නංවා ඇත. 2021 වර්ෂය තුළදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජකයකු තෝරා ගැනීමට ව්‍යාපෘති යෝජනා කැඳවීම සිදු කරන ලද අතර ලද යෝජනා ඇගයීම මේ වන විට සිදු කරමින් පවතී.<br><br>• මධ්‍යම හා පහළ ස්වභාවික වායු වෙළඳපල සඳහා නෛතික නියාමන රාමුවක් සකස් කිරීම සඳහා ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කර 2020.10.17 දින ප්‍රකාශයට පත්කරන ලද අතර එහි සඳහන් වායු උපයෝජන ප්‍රධාන සැලැස්ම (Gas Utilization Master Plan) සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.<br>• ලිහිසි තෙල් සඳහා ජාත්‍යන්තරව පිළිගත් අවම ප්‍රමිතීන් ශ්‍රී ලංකාව තුළ හඳුන්වා දීම සඳහා 2021 වර්ෂය තුළදී කටයුතු කර ඇත. | ළඟාකර ගැනීමට අදාළ කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය අවසානයේදී අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 93 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 70 ක් විය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 07 ක් ඇතුළුව පුරප්පාඩු 23 ක් පැවතුණි. | පවතින ජ්‍යෙෂ්ඨ ගණයේ පුරප්පාඩු 04 න් ප්‍රධාන ඉංජිනේරු තනතුර, නීති නිලධාරී තනතුර හා ගණකාධිකාරී තනතුර පිරවීමට අවශ්‍යතාවයක් දැනට මතුවී නොමැති බැවින්, එම පුරප්පාඩු පිරවීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. දැනට පුරප්පාඩුව පවතින සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) තනතුරේ රාජකාරී තාවකාලිකව සහකාර අධ්‍යක්ෂ (පාලන) විසින් සිදු කරනු ලබයි. | කාර්ය මණ්ඩල ඌනතාවය අමාත්‍යාංශයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොවේ නම් කාර්යය මණ්ඩල සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලිහිසි තෙල්, තාර, නැව් තෙල් ව්‍යාපාරය ආදී කටයුතු ශ්‍රී ලංකාව තුළ ක්‍රියත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාදීම හා ඒ ඒ අංශවල මූලික නියාමන කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරනු | ඛනිජ තෙල් ආශ්‍රිත කර්මාන්තය නියාමනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන, ඒ අනුව, නියාමන අංශයක් ස්ථාපිත කිරීමටත්, එහි කාර්යභාරය සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහාත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කිහිපයක් ඉදිරිපත් කර | ලිහිසි තෙල්, තාර, නැව් තෙල් ව්‍යාපාරය ආදී කටයුතු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාදීම හා ඒ ඒ අංශවල මූලික |

ලැබේ. මෙම ක්ෂේත්‍ර පාලනයට හා නියාමනයට ඒ ඒ විෂයට අදාල විශේෂිත තාක්ෂණික දැනුමක් සහිත වෘත්තිය නිලධාරීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අත්‍යාවශ්‍ය වුවද, අමාත්‍යාංශය තුළ එවැනි වෘත්තිය නිලධාරීන් නොමැති බවටත් එකී කාර්යයන් විධිමත්ව ඉටු කිරීමට හැකි වන ලෙස ආයතනික රාමුව සකස් කොට නොමැති බවටත් නිරීක්ෂණය විය.

තිබුණි. අවසානයට ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය සැළකිල්ලට ගනිමින් අංක 21/1867/325/020-1 හා 2021.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඛනිජ තෙල් ආශ්‍රිත කර්මාන්තය නියාමනයද ඇතුළත්ව, 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් පනතට කරනු ලබන සංශෝධනයක් පිළිබඳව භාණ්ඩාගාර ලේකම් සමග සාකච්ඡා කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර තිබුණි. ඒ අනුව, 2021.12.21 දින මේ පිළිබඳව භාණ්ඩාගාර නිලධාරීන් සමහ සාකච්ඡා කරන ලදි. ඒ අනුව, අමාත්‍යාංශයට නිත්‍ය අතිරේක වැය බරක් දරමින් විශේෂ තාක්ෂණික හා වෘත්තීය දැනුම සහිත නිලධාරීන් බඳවා ගෙන නව නියාමන අංශයක් පිහිටුවීමට වඩා අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් සහිත නිලධාරීන්ගේ දායකත්වය ලබාගෙන ආයතන කිහිපයක සාමූහික කාර්යයක් සේ මෙම නියාමන කාර්යයන් ඉටු කිරීම වඩා සුදුසු බවට තීරණය විය.

නියාමන කටයුතු වලට අදාල විශේෂිත තාක්ෂණික දැනුමක් සහිත වෘත්තිය නිලධාරීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් පිරවීමට හෝ ඊට උචිත ආයතනික රාමුවක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.